ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
පුවත්පත් නිවේදනය
****

<u>විශේෂ දැනුම් දීමයි</u>

විවිධ ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් වීසා සහ කොන්සියුලර් සේවා සඳහා ඉල්ලීම් රැසක් කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට ලැබී ඇත. සෑමවිටම මෙන් මහ කොමසාරිස් කාර්යාලය සහ කාර්ය මණ්ඩලය මෙම ඉල්ලීම් හැකි උපරිම අයුරින් ඉටු කිරීමට කැප වී සිටියි.

2. ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය සැලකීමේදී නිල මූලාශ්‍ර (https://hpb.health.gov.lk/) අනුව කොවිඩ් ආසාදිතයන් සහ මරණ සංඛ්‍යාව අවාසනාවන්ත ලෙස ඉහළ ගොස් ඇති අතර ගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇති කොවිඩ් වෛරසයේ ඩෙල්ටා ප්‍රභේදය ද රට තුළ දක්නට ලැබේ. ඒ අනුව මහජන සෞඛ්‍යය සැලකිල්ලට ගෙන මහ කොමසාරිස් කාර්යාලය සේවකයන්ගේ පැමිණීම සහ කාර්යාලයේ හැසිරීම කොවිඩ් වසංගත ව්‍යාප්තිය අවම වන පරිදි සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව ඇතැම් විට කොන්සියුලර් සහ වීසා කටයුතු ඇතුළු මහජන සේවාවන් ඉටු කිරීමට වඩා වැඩි කාලයක් ගත වනු ඇත.

3. එබැවින් මහ කොමසාරිස් කාර්යාලයෙන් වීසා සහ කොන්සියුලර් සේවාවන් ලබා ගැනීමට අපේක්ෂා කරන අය මෙම කරුණු පිළිබඳව සැලකිලිමත් වෙමින් තම කටයුතු සැලසුම් කරගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

4. ආරක්ෂිත සහ කොවිඩ් වසංගතයට අනුකූල සංචාරයන් හරහා දෙරට ජනතාව අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම තුළින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින දිගු කාලීන, සමීප මිත්‍රශීලී සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට දක්වන කැපවීම මහ කොමසාරිස් කාර්යාලය අවධාරණය කර සිටියි.

***

කොළඹ
2021 අගෝස්තු 02